Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

**Pearson Edexcel International GCSE (9–1)**

Centre Number | Candidate Number

**Time** 2 hours 30 minutes

**Paper reference** **4SI1/01**

# Sinhala

## PAPER 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided – *there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets – *use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.
- Good luck with your examination.

*Turn over*

P66499A
©2021 Pearson Education Ltd.
1/1/1/1/



Pearson

## SECTION A: READING

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒. If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒. Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති **සිංහල** වාක්‍යවල හිස් තැන් පුරවන්න. වගුවේ ඇති පිළිතුරුවලින් නිවැරදි පදය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

කොළඹ

ඔබ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට බලාපොරොත්තුවෙන් සිටින සංචාරකයෙකු නම් එහි වාණිජ අගනගරය වන කොළඹ නගරයේ දින කිහිපයක් ගත කිරීමට අමතක නොකරන්න. මිලියන 21ක් වන එරට වාසය කරන ජනතාවගෙන් බහුතරයක් ජීවත් වන කොළඹ නගරය ශ්‍රී ලංකා සිතියමේ බස්නාහිර පළාතේ පිහිටා ඇත.

ශ්‍රී ලංකාවට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගෙන් වැඩි පිරිසකගේ ප්‍රවේශ දොරටුව වන මෙම සිත් ඇදගන්නා සුලු මනරම් නගරයේ ඇති වැදගත් ස්ථාන නැරඹීමෙන් තොර ව එම නගරය පසු කර යාමට උත්සාහ නොගන්න.

නවීන පන්නයේ ජීවන රටාවෙන් පොහොසත් මෙම නගරය නෙළුම් කුළුණ, නිදහස් චතුරශ්‍රය, ගංගාරාම විහාරස්ථානය වැනි සුප්‍රසිද්ධ ගොඩනැගිලිවලින් සමන්විත ය. පස්වන සියවස තරම් ඈත අතීතයකට උරුමකම් කියන වරාය නගරයක් වන කොළඹ නගරය ආසියාව හා යුරෝපය අතර වෙළඳාම් කටයුතු සඳහා කදිමට ගැලපෙන සංධිස්ථානයකි.

ශ්‍රී ලංකාවට බලපාන මෝසම් ඍතු දෙක හැරුණු විට සාමාන්‍යයෙන් වර්ෂයේ වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ කාලගුණය යහපත් ය. නිරිත දිග මෝසම් සමය මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වාත් ඊසාන දිග මෝසම් කාලය දෙසැම්බර් මාසයේ සිට අප්‍රේල් මාසය දක්වාත් පවතියි. කොළඹ නගරයට වර්ෂාව ලැබෙන්නේ නිරිත දිග මෝසමෙනි.

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

| | | | |
|---|---|---|---|
| **A** වාණිජ අගනගරය | **B** නව | **C** පැරණි | **D** නීරස |
| **E** දෙකක් | **F** එකක් | **G** සාමාන්‍ය | **H** දර්ශනීය |
| **I** වෙළඳාම | **J** ප්‍රධාන | **K** බටහිර | **L** නැගෙනහිර |
| **M** සුප්‍රසිද්ධ | | | |

| උදාහරණය: | කොළඹ ශ්‍රී ලංකාවේ වාණිජ අගනගරයයි. | *A* |
|---|---|---|
| **1** (a) | රටේ ......... දෙසින් කොළඹ පිහිටා ඇත. | |
| **1** (b) | කොළඹ ......... නගරයකැ'යි රචකයා කියයි. | |
| **1** (c) | නගරය තුළ ......... ගොඩනැගිලි රාශියක් ඇත. | |
| **1** (d) | කොළඹ යනු ......... වරාය නගරයකි. | |
| **1** (e) | රටවල් අතර ......... සඳහා මෙම වරාය සුදුසු ය. | |
| **1** (f) | ලංකාවේ මෝසම් කාල ......... පවතී. | |

**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**2** කුළුබඩු ගැන කථා කරන මෙම ළමුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකි ය.


### ඖෂධීය කුළුබඩු

**පූර්විත්**



ඖෂධීය කුළුබඩු භාවිතය ඉතිහාසය පුරා ම ඉතා වැදගත් කොට සලකනු ලැබී ය. ඖෂධ පැලෑටි හා කුළුබඩුවල ඇති සෞඛ්‍යමය වාසි අතිශයින් වැදගත් ය. ඒවායින් බොහොමයක් බොහෝ රෝගවලට ඵලදායී ප්‍රතිකාරයක් ලෙස භාවිත වන බවට සාක්ෂි ලැබෙමින් තිබේ. ප්‍රසන්න සුවඳ සහ වර්ණය නිසා ඇත්ත වශයෙන් ම මම කුළුබඩු යොදා පිසූ ආහාරවලට කැමතියි. කුළුබඩු සහිත ආහාර දැන් ලොව පුරා ප්‍රසිද්ධයි.

**නවිඩ්**



ආහාර පිසීමේ දී ශාකසාර කුළුබඩු යොදා ගැනීමට කැමති වන නමුත් ඒවායේ කිසිඳු ඖෂධීය ගුණයක් ඇතැයි මම පිළිගන්නේ නැහැ. මගේ අම්මා සෑම දිනක ම ආහාර පිසින අතර ඇය අපේ පවුලේ අය සඳහා ආහාර පිළියෙළ කරන විට සෑම වර්ගයක ම කුළුබඩු භාවිත කරයි. කුළුබඩු සහිත ආහාර සත්‍ය වශයෙන් ම රසයි. එහි රසය, වර්ණය හා සුවඳ නිසා ඇය පිසින ආහාර අනුභව කිරීමට මම කැමතියි. මම ආහර අනුභව කරන්නේ බෙහෙත් යැයි සිතා නොවේ.

**තිසරි**



මම කැමති සරල හා රසවත් ආහාරවලට පමණයි. මට කිසිසේත් ම සැර ආහාර අනුභව කළ නොහැකියි. අහම්බෙන් හෝ කුළුබඩු සහිත සැර ආහාරයක් අනුභව කිරීමට සිදු වුවහොත් මට බොහෝ පීඩා විඳීමට සිදු වේ. සැර කුළුබඩු සහිත ආහාර මගේ මුඛය හා ආමාශය පුළුස්සා දමයි. අනෙක් අතට එම කුළුබඩුවල කිසිඳු ඖෂධීය වටිනාකමකුත් නැති බැවින් මා විශ්වාස කරන්නේ බටහිර ඖෂධ පමණයි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P66499A0420

| | | පූර්විත් | නවිඩ් | තිසරි |
|---|---|---|---|---|
| **උදාහරණය:** | ඓතිහාසික සාක්ෂි ඇති බව කියයි. | ☒ | ☐ | ☐ |
| **A** | ඖෂධයක් ලෙස ගුණදායක බව පවසයි. | ☐ | ☐ | ☐ |
| **B** | වර්ණවත් ආහාරවලට කැමති ය. | ☐ | ☐ | ☐ |
| **C** | බෙහෙතක් ලෙස නොපිළිගනියි. | ☐ | ☐ | ☐ |
| **D** | ආහාරවල රසය ගැන කථා කරයි. | ☐ | ☐ | ☐ |
| **E** | කුළුබඩු සහිත ආහාර ප්‍රිය නොකරයි. | ☐ | ☐ | ☐ |
| **F** | සැර හා මෘදු ආහාර වර්ග දෙකට ම කැමති ය. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**3** පරිසර දූෂණය පිළිබඳ පහත සඳහන් ලිපිය කියවන්න. පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් **සිංහල** වචන යොදා පුරවන්න.

පරිසර දූෂණය

ලෝකයේ බොහෝ රටවල් තම තමන්ගේ රටවල සංවර්ධනය සඳහා විවිධ සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කරන අතර ශ්‍රී ලංකාව තුළ ද එබඳු සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කෙරිණි. එම සංවර්ධන සැලසුම් හා කාර්මීකරණය නිසා මේ වන විට රට තුළ මිනිසාට බලපාන පරිසර ගැටලු රාශියක් නිර්මාණය වී ඇත. විශේෂයෙන් ම මෙම සංවර්ධන සැලසුම් නිසා පරිසර දූෂණයත් කාර්මීකරණය නිසා කැළිකසළ ගැටලුවත් නිර්මාණය වී ඇත.

මෙම කැළිකසළ ගැටලුව විසඳීම සඳහා සියලු දෙනා එක්ව සුදුසු පියවර නොගැනීම කනගාටුවට කරුණකි. අප විසින් ඉවතලන කසළ අපගේ සෞඛ්‍යයට සෘජුව ම බලපායි. අපගේ පරිසරය ආරක්ෂිතව හා පිරිසිදුව තබා ගැනීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ කර්මාන්තශාලා හිමිකරුවන්ට වන අතර ඔවුන් ඒවා වගකීමෙන් යුතුව බැහැර කළ යුතු ය.

විශාල වශයෙන් දුම පිට කරන බැවින් නූතන ලෝකයේ පරිසර දූෂණයට ප්‍රධාන වශයෙන් දායක වන්නේ කර්මාන්ත ශාලා හා ප්‍රවාහන මාධ්‍යයන් ය. ඒවායින් නිකුත් වන දුම නිසා වායුව දූෂණය වීම හේතුවෙන් ස්වසන ආබාධ ඇතිවේ.

භයානක රසායනික ද්‍රව්‍යවලින් පිරුණු එම දුමාරය වැසි ජලය හා එක්ව අම්ල බවට පත් වී පෘථිවි පෘෂ්ඨය මත වැටී ඒ මත ඇති ජලය දූෂණය වේ. තවද, ඇතැම් කර්මාන්තශාලා ඔවුන්ගේ අපද්‍රව්‍ය මිශ්‍ර ජලය ගංගාවලට මුදා හරිති. මෙම දූෂිත ජලය ශාක සහ සත්ත්වයින්ට අහිතකර ලෙස බලපායි.

කසළ ප්‍රමාණය වර්ධනය වීම හා භූමිය ගැන සැලකිලිමත් නොවීම යන කරුණු කෙරෙහි ශ්‍රී ලංකාවේ විශේෂඥයෝ ඉතා විමසිල්ලෙන් සිටිති. අපගේ මාතෘ භූමිය කුණු කන්දකින් වැසී යන දිනය වැඩි ඈතක නොවේ. සෑම පුරවැසියෙකුටම තම වටපිටාව පවිත්‍රව තබා ගැනීමට වගකීමක් ඇති අතර පාසල් මගින් පරිසරයේ ඇති වටිනාකම දරුවන්ට ඉගැන්විය යුතු ය.



P66499A0620

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

උදාහරණය: විවිධ රටවල සංවර්ධනය සඳහා ........ සංවර්ධන උපාය මාර්ග ........ ආරම්භ කෙරිණි.

(a) කාර්මීකරණය නිසා විශාල වශයෙන් .................................................. එක් රැස් වේ. **(1)**

(b) කැළිකසළ ගැටලුව නොවිසඳී අත්තේ .................................................. හේතුවෙනි. **(1)**

(c) අප නිපදවන කසළ .................................................. බලපායි. **(1)**

(d) කසළ කළමණාකරණය කිරීමේ වගකීම පැවරී අත්තේ .................................................. අතය. **(1)**

(e) ප්‍රධාන වශයෙන් වායුව දූෂණය වන්නේ .................................................. හා

.................................................. නිසා ය. **(2)**

(f) .................................................. හා .................................................. නිසා ජලය දූෂණය වේ. **(2)**

(g) .................................................. ජීවීන්ගේ හා ශාකවල පැවැත්මට අහිතකර ලෙස බලපායි. **(1)**

(h) ජනතාවගේ ඉඩම් ගැන .................................................. විමසිල්ලෙන් සිටිති. **(1)**

(i) පුරවැසි වගකීම වන්නේ පරිසරය .................................................. තබා ගැනීමය. **(1)**

(j) පාසලේදී .................................................. සිසුන්ට කියා දියි යුතු ය. **(1)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** නුවන් නයනජිත් කුමාර මහතා විසින් රචිත **"අමරදේව මහා ගාන්ධර්ව විබුධයාණෝ"** නමැති කෘතියෙන් උපුටා ගන්නා ලද පහත සඳහන් ඡේදය කියවන්න.

## ආචාර්ය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේව

"ගීත රචනයෙහිලා අමරදේවයන් දක්වා ඇති කුසලතාව ඔහු සතු වාදන හා ගායන කෞශල්‍ය තරම් ම විශිෂ්ට ය. නාද රටාවකට ගැලපෙන පද තෝරා ගැනීම විවේක බුද්ධියෙන් යුතු කලාකරුවෙකුට පමණක් කළ හැක්කකි. රාගවලට උචිත තනු ද තනුවලට උචිත පද ද සූක්ෂම ලෙස හඳුනාගැනීමේ ශක්තියක් අමරදේවයන් තුළ පවතී.

ගීතයක උපත දෙයාකාරයකින් සිදුවේ. කාව්‍ය නිර්මාණයක් පදනම් කර ගනිමින් සංගීත රටාවක් නිමැවීම එක් ක්‍රමයකි. සංගීත කල්පනාවක් වස්තු බීජය කර ගනිමින් ඊට උචිත පද මාලාවක් ඒ මත බහාලීම අනෙක් ක්‍රමයයි. නිර්මාණයෙහිලා කවර ක්‍රමයක් අනුගමනය කළ ද රසිකයා කෙරෙහි බලපාන්නේ කෘතියෙහි අවසාන ඵලය ම බව සංගීත රචකයා දැන සිටිය යුතු ය. එසේ වුව ද සංගීතමය අගයෙන් පරිපූර්ණ වූ ගීත නිර්මාණයකට තුඩු දෙන ප්‍රශස්තතම ක්‍රමය යට දැක්වූ දෙවන ක්‍රමය බව කිව යුතු ය. එබඳු ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් චිත්‍රසේනගේ 'නල දමයන්ති' මුද්‍රා නාටකය සඳහා අමරදේව නිර්මාණය කළ 'ඈත කඳුකර හිමව් අරණේ' ගීතය නිදසුන් කළ හැකි ය.

අමරදේව මහතා සිය සංගීත ඥානයෙන් සිංහල සිනමාවට විශාල දායකත්වයක් දුන් අතර ඔහුටම අනන්‍ය ශෛලිය ශ්‍රී ලාංකේය සංගීතයට නව අනන්‍යතාවක් එක් කළේ ය. ශ්‍රී ලංකාවේ සංගීතයට ඔහුගෙන් ලද දායකත්වය අගයනු වස් එතුමා බොහෝ සම්මානවලින් හා ගෞරව නාමවලින් පිදුම් ලැබීය. 2001 වසරේ දී ඔහු ලද රැමෝන මැග්සසේයි සම්මානය ඔහු ලැබූ විශිෂ්ටතම සම්මානයයි."

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P66499A0820

**4** (a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න. පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) අමරදේව මහතා සතුව පැවති කුසලතා දෙකක් නම් කරන්න. **(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(ii) ගීත නිර්මාණ කරන ක්‍රම මොනවාද? ක්‍රම දෙකක් ලියන්න. **(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

(iii) සංගීත රචනයේ දී රචකයන් දැන සිටිය යුත්තේ කුමක් ද? **(1)**

..............................................................................................................................................

(iv) සංගීතමය වශයෙන් වඩා පොහොසත් කුමන ගීත වර්ගය ද? **(1)**

..............................................................................................................................................

(v) අමරදේව සංගීතවත් කළ නාට්‍යයක් නම් කරන්න. **(1)**

..............................................................................................................................................

(vi) ශ්‍රී ලංකාවේ සංගීතය විෂයෙහි අමරදේව මහතාගේ ආභාසය කෙබඳු ද? **(1)**

..............................................................................................................................................

(vii) අමරදේව මහතාගෙන් සංගීතයට සිදු වූ සේවය අගය කළේ කෙසේ ද? කරුණු දෙකක් දක්වන්න. **(2)**

..............................................................................................................................................

..............................................................................................................................................

DO NOT WRITE IN THIS AREA

**4** (b) සිංහල ගීත කලාවේ මුල් යුගය ගැන මෙම තරුණිය හා තරුණයා අතර කෙරෙන සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.

ඔලිවියා
අපේ රටේ ජනප්‍රිය ගීතයේ ආරම්භය සිදු වූ මුල් කාලයේ කණ්ඩායම් සංගීතයට අවස්ථාවක් තිබුණු බවක් පෙනෙන්නට නැහැ. එකල වැඩි වශයෙන් ගීත ලෝලීන් අතර ජනප්‍රිය වෙලා තිබුණේ ඒකල ගීත හෝ යුග ගීත හෝ බවයි බැලූ බැල්මට පෙනෙන්නේ. ඒකල ගීත වශයෙන් හඳුන් වන්නේ එක් අයෙකු විසින් ගායනා කරනු ලබන ගීත හෙවත් තනි පුද්ගලයෙකු විසින් ගායනා කරන ගීතයි. යුග ගීත වශයෙන් හඳුන්වන්නේ දෙදෙනෙකු විසින් ගයනු ලබන ගීතයි. එම ගීතවලට පසුබිම වුණේ බුදු ගුණ හෝ මව්පිය ගුණ හෝ පරිසර වර්ණනා හෝ බව ඉතා පැහැදිලියි. එම ගායනාවල අර්ථ රසය, සංගීත රසය වගේ ම හොඳ පණිවිඩයකුත් ගැබ්වෙලා තිබුණා. ගී පද රචනය ඉතා ම නිවැරදි භාෂාවකින් හා උසස් සාහිත්‍ය රසයකින් පෝෂණය වී තිබුණා. ඒ නිසා එම ගීත අසන්නාට එයින් යහපතක් මිස කිසි ම අයහපතක් සිදු වූයේ නැහැ.

ජේසන්
ඔබ පවසන්නේ සත්‍යයක් වන්නට පුළුවන්. එහෙත් සිංහල ගීතයේ ආරම්භයේ සිට ම අපේ රටේ කණ්ඩායම් සංගීතයත් පැවති බවට සාක්ෂි තිබෙනවා. ලා බම්බාස් වැනි සංගීත කණ්ඩායම් එකල ප්‍රසිද්ධියට පත්ව තිබුණු බව අපි කවුරුත් අසා තිබෙනවා. ඔවුන්ගේ කණ්ඩායම් ගීත වේග රිද්මයට හා බටහිර සංගීත ශෛලියට ළං ව ගැයුණු නිසාත් එම ගීතවලට ගුවන් විදුලිය තුළ සාධාරණ අවස්ථාවක් නො ලැබුණු නිසාත්, එකල රට පිළිගත් ගීත විචාරකයන් හා උගතුන් විසින් ඒවා උසස් ගී නිර්මාණ වශයෙන් පිළිගැනීමට මැළිකමක් දැක්වීම නිසාත් එම ගීතවලට හිමි නිසි තැන ලැබුණේ නැහැ. නමුත් ඒවාට සමාජයේ හොඳ ඉල්ලුමක් තිබුණා. ඒවායින් සමහරක් අදත් ඉතා ජනප්‍රියයි. ඔවුන් උත්සව අවස්ථා හා මගුල් ගෙවල් වැනි ප්‍රීතිමත් අවස්ථාවල සංගීත භාණ්ඩ වයමින් ගී ගයමින් හා නටමින් වේග රිද්මයට ගී ගැයුවා. ඔවුන් නිසා රටේ එළිමහන් ගීත ප්‍රසංග කලාවක් බිහිවුණා. එම සංගීත කණ්ඩායම් පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදු වී නැති බවයි මගේ හැඟීම. ඔවුන් ලාංකේය සංගීත ක්ෂේත්‍රයට කර ඇති සේවය විශිෂ්ටයි.

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- එකල බිහි වූ ගීත: **(1)**
- එම ගීතවල පදමාලා: **(1)**

.......................................................................................................................................................

.......................................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- කණ්ඩායම් සංගීතයට තිබුණු බාධක: **(1)**
- කණ්ඩායම් සංගීතයේ භූමිකාව: **(1)**

.......................................................................................................................................................

.......................................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**SECTION B: WRITING**

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

මහජන සෞඛ්‍ය සේවය

සේවා කිහිපයක්

එම සේවාවේ ඇති වාසි

මෑතක දී ඔබේ පවුලේ අයෙක් ලැබූ සේවාවක්

සෞඛ්‍ය සේවයේ අනාගතය

වචන 85ක් පමණ භාවිත කරමින් මහජන සෞඛ්‍ය සේවය ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ල ම භාවිත කළ යුතු ය.

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරාගෙන වචන 145ක පමණ **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඔබ තෝරාගත් විකල්පයට අදාළ ව පිළිතුරු සපයන්න.

## පළමු විකල්පය

(a)



විනෝදාංශයක් ලෙස ගෙවතු වගාවෙන් සෞඛ්‍යසම්පන්න ආහාර හා කායික මානසික සුවතාව යන දෙකම ලබා ගත හැකි බව මෑතක දී ඔබ නැරඹූ රූපවාහිනී වැඩ සටහනකින් කියැවිණි. කරුණු ගෙන හැර දක්වමින් මෙම කියමන තහවුරු කරන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- ගෙවතු වගා කිරීම වැනි විනෝදාංශයක් පුරුදු වීමේ ඇති වටිනාකම
- ඔබේ වැඩිහිටියන් එකල ගෙවතුවල එළවළු හා පළතුරු වගා කළ අයුරු
- අද කාලයේ ගෙවත්තක් පවත්වා ගැනීමේ ඇති වාසි

**(26)**

## දෙවන විකල්පය

(b) ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වූ ජාත්‍යන්තර තරඟයකින් ජයග්‍රහණය කළ නව නිපැයුම් කරුවෙකු යැයි සිතා නව නිර්මාණ ගැන පුවත් පතකට ලිපියක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- නව නිර්මාණ හා තාක්ෂණික මෙවලම්
- එම නිපැයුම් සොයා ගන්නට පෙර මිනිසුන් වැඩපල කළ ආකාරය
- නව නිපැයුම් නිසා මිනිස් ජීවිත පහසු වන හැටි

**(26)**

තෙවන විකල්පය

(c) ඔබ නිවසේ දෙමාපියන් හා සොයුරු සොයුරියන් සමග රැඳී සිටිමින් වඩාත්ම විනෝද වන කටයුත්තක් ගෙනහැර දක්වමින් ඔබේ මිතුරෙකුට විද්‍යුත් තැපෑලක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- මාපිය සොහොයුරු සබඳතාවල ඇති වටිනාකම
- මැකී යන අතීත පවුල් සංස්ථාවේ ස්වභාවය
- අනාගත මානව සමාජ තුළ එම සබඳතාවලට ඇති ඉඩ

**(26)**

**Indicate which question you are answering by marking a cross ☒. If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒.**

☒ **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA



P 6 6 4 9 9 A 0 1 4 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**SECTION C: TRANSLATION INTO SINHALA**

**Write your answer in the space provided.**

**7** පහත සඳහන් ඡේදය සිංහලට නගන්න.

D. R. Wijewardene is one of Sri Lanka's great men of this era and is regarded as a leading journalist. There are many yardsticks by which to measure one's greatness. His devotion to his country is evident in deeds not in words. The service he rendered to his people must be determined not by searching for what he said, but by searching for what he did.

He established seven newspapers and trained a generation of gifted journalists to man these newspapers. He organised an able administration and installed printing machinery which could print 20,000 copies per hour in colour.

**(20)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

**BLANK PAGE**

**Source information**

**Question 1**
Source from: https://www.thecommonwanderer.com/blog/sri-lanka-travel-guide

**Question 2**
© greenaperture/Getty Images
© ajijchan/Getty Images
© bijendrakumar Makwana/Getty Images

The Top 100 Herbal Remedies By Anne McIntyre © Watkins Media

**Question 3**
Source from: http://203.115.26.10/2019/TheSobha.pdf

**Question 6**
© niroshanSL/Getty Images

Source from: http://www.rjt.ac.lk/agri/agri_onlinematerials/agricultural_systems/Sri%20Lankan%20Home%20Garden%20and%20Household%20Food%20security%20GAS%20Ginigaddara.pdf

**Question 7**
Source from: http://www.dailynews.lk/2020/02/22/features/212211/patriot-journalist-newspaper-magnate-and-man



P66499A02020

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA